තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන
මහාවිහාර වංශික ශ්‍යාමෝපාලි මහා නිකායේ
මහානායක ස්ථවිර,
මල්වතු මහාවිහාරය, මහනුවර, ශ්‍රී ලංකාව

වරකාගොඩ ධම්මසිද්ධි ශ්‍රී පඤ්ඤානන්ද ඤාණරතනාභිධාන
මහාවිහාර වංශික ශ්‍යාමෝපාලි මහා නිකායේ
මහානායක ස්ථවිර,
අස්ගිරි මහාවිහාරය, මහනුවර, ශ්‍රී ලංකාව

2021.08.18

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා,
ජනාධිපති කාර්යාලය,
ගාලුමුවදොර,
කොළඹ 01.

ගරු ජනාධිපතිතුමනි,

**කොරෝනා වෛරස ව්‍යාප්තිය පාලනය සඳහා සතියක කාලයක් රට වසා තැබීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටීම**

කොරෝනා වෛරස ව්‍යාප්තිය ආරම්භක අවස්ථාවේ දී නිරෝධායන ඇඳිරි නීතිය පනවා ජනතාවට සහන සලසමින් ජන ජීවිතය සුරක්ෂිත කරනු වස් ගරු ජනාධිපතිතුමන්ගේ හා අග්‍රාමාත්‍යතුමන්ගේ නායකත්වයෙන් රජය විසින් ගෙන ගිය විධිමත් වැඩ පිළිවෙළ ප්‍රශංසාර්හ ය. එය ලෝක සෞඛ්‍ය සංවිධානය ඇතුළු විවිධ ජගත් සංවිධානයන්ගේ ඇගයීමට ද පාත්‍ර විය. තව ද මේ වන විට ප්‍රතිශක්තීකරණ එන්නත් ලබාදෙමින් ජන ජීවිත සුරක්ෂිත කිරීම පිණිස සිදුකරනු ලබන සාර්ථක එන්නත්කරණ වැඩ පිළිවෙළ පිළිබඳ ව ද අපගේ ප්‍රශංසාව ගරු ජනාධිපතිතුමන් ප්‍රමුඛ රජය වෙත පිරිනමනු කැමැත්තෙමු.

එහෙත් කොරෝනා වෛරසයේ දැඩි ව්‍යාප්තිය හේතුවෙන් අද වන විට සමස්ත රටවාසීහු මහත් ව්‍යසනයකට මුහුණ පා සිටිති. ආසාදිතයන් සංඛ්‍යාව මෙන් ම මරණ සංඛ්‍යාව ද දිනෙන් දින ඉහළ යමින් පවතී. නව විකෘති වෛරස ප්‍රභේදයන්ගේ දරුණු බව හා සීඝ්‍ර ව්‍යාප්තිය හේතුවෙන් එය පාලනය කිරීමේ අපහසුතාව සෞඛ්‍ය අංශ විසින් පෙන්වා දී ඇත. ඉදිරි මාස කිහිපය තුළ දී ශ්‍රී ලංකාව තුළ ඇති විය හැකි දැවැන්ත සෞඛ්‍ය අර්බුදයක් පිළිබඳ ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් ද අනතුරු ඇඟවා ඇත.

එහෙයින් මෙම ආපදාපන්න අවස්ථාවේ ජන ජීවිතය සුරක්ෂිත කරනු වස් සෞඛ්‍ය විශේෂඥයන්ගේ උපදෙස් හා නිර්දේශ පරිදි සතියක පමණ කාලයකට හෝ රට වසා දමා ජනතාවට අවශ්‍ය පහසුකම් සලසමින් රෝග ව්‍යාප්තිය පාලනය උදෙසා පියවර ගන්නේ නම් සුදුසු බව මෙයින් කාරුණිකව සිහිපත් කරනු කැමැත්තෙමු.

රත්නත්‍රයේ ආශීර්වාදයෙන් මෙම වසංගත ව්‍යාප්තිය පාලනය කොට ජන ජීවිතය සුරක්ෂිත කිරීමට ඔබතුමන්ට ශක්තිය, ධෛර්යය සැලසේ වා.

ඒ වගත් මෙසේ ම,

.........................................

මහනුවර උඩුපුස්සැල්ලාවේ පුෂ්පාරාම විහාරාධිපති,
තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන,
මහාවිහාරවංශික ශ්‍යාමෝපාලි මහානිකායේ,
මහානායක ස්ථවිරයන් වහන්සේ,
මල්වතු මහාවිහාරය - මහනුවර.

.........................................

හයගිරි විජයසුන්දරාරාම විහාරාධිපති
වරකාගොඩ ධම්මසිද්ධි ශ්‍රී පඤ්ඤානන්ද ඤාණරතනාභිධාන
මහාවිහාරවංශික ශ්‍යාමෝපාලි මහානිකායේ,
මහානායක ස්ථවිරයන් වහන්සේ,
අස්ගිරි මහාවිහාරය - මහනුවර.

Scanned with CamScanner

තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන
මහාවිහාර වංශික ස්‍යාමෝපාලි මහා නිකායේ
මහානායක ස්ථවිර,
මල්වතු මහාවිහාරය, මහනුවර, ශ්‍රී ලංකාව

වරකාගොඩ ධම්මසිද්ධි ශ්‍රී පඤ්ඤානන්ද ඥාණරතනාභිධාන
මහාවිහාර වංශික ස්‍යාමෝපාලි මහා නිකායේ
මහානායක ස්ථවිර,
අස්ගිරි මහාවිහාරය, මහනුවර, ශ්‍රී ලංකාව


ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා,
අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය,
අංක 58,
ශ්‍රීමත් ඞී ද සිල්වා මාවත,
කොළඹ 07.

2021.08.18

ගරු අග්‍රාමාත්‍යතුමනි,

**කොරෝනා වෛරස ව්‍යාප්තිය පාලනය සඳහා සති දෙකක කාලයක් රට වසා තැබීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටීම**

කොරෝනා වෛරස ව්‍යාප්තිය ආරම්භක අවස්ථාවේ දී නිරෝධායන ඇඳිරි නීතිය පනවා ජනතාවට සහන සලසමින් ජන ජීවිතය සුරක්ෂිත කරනු වස් ගරු ජනාධිපතිතුමන්ගේ හා අග්‍රාමාත්‍යතුමන්ගේ නායකත්වයෙන් රජය විසින් ගෙන ගිය විධිමත් වැඩ පිළිවෙළ ප්‍රශංසාර්හ ය. එය ලෝක සෞඛ්‍ය සංවිධානය ඇතුළු විවිධ ජගත් සංවිධානයන්ගේ ඇගයීමට ද පාත්‍ර විය. තව ද මේ වන විට ප්‍රතිශක්තිකරණ එන්නත් ලබාදෙමින් ජන ජීවිත සුරක්ෂිත කිරීම පිණිස සිදුකරනු ලබන සාර්ථක එන්නත්කරණ වැඩ පිළිවෙළ පිළිබඳ ව ද අපගේ ප්‍රශංසාව ගරු ජනාධිපතිතුමන් ප්‍රමුඛ රජය වෙත පිරිනමනු කැමැත්තෙමු.

එහෙත් කොරෝනා වෛරසයේ දැඩි ව්‍යාප්තිය හේතුවෙන් අද වන විට සමස්ත රටවාසීහු මහත් ව්‍යසනයකට මුහුණ පා සිටිති. ආසාදිතයන් සංඛ්‍යාව මෙන් ම මරණ සංඛ්‍යාව ද දිනෙන් දින ඉහළ යමින් පවතී. නව විකෘති වෛරස ප්‍රභේදයන්ගේ දරුණු බව හා සීඝ්‍ර ව්‍යාප්තිය හේතුවෙන් එය පාලනය කිරීමේ අපහසුතාව සෞඛ්‍ය අංශ විසින් පෙන්වා දී ඇත. ඉදිරියේ දී ශ්‍රී ලංකාව තුළ ඇති විය හැකි දැවැන්ත සෞඛ්‍ය අර්බුදයක් පිළිබඳ ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් ද අනතුරු අඟවා ඇත.

එහෙයින් මෙම ආපදාපන්න අවස්ථාවේ ජන ජීවිතය සුරක්ෂිත කරනු වස් සෞඛ්‍ය විශේෂඥයන්ගේ උපදෙස් හා නිර්දේශ පරිදි සතියක පමණ කාලයකට හෝ රට වසා දමා ජනතාවට අවශ්‍ය පහසුකම් සලසමින් රෝග ව්‍යාප්තිය පාලනය උදෙසා පියවර ගන්නේ නම් සුදුසු බව මෙයින් කාරුණිකව සිහිපත් කරනු කැමැත්තෙමු.

රත්නත්‍රයේ ආශීර්වාදයෙන් මෙම වසංගත ව්‍යාප්තිය පාලනය කොට ජන ජීවිතය සුරක්ෂිත කිරීමට ඔබතුමන්ට ශක්තිය, ධෛර්යය සැලසේ වා.

ඒ වගත් මෙසේ ම.

තිබ්බටුවාවේ සුමංගල
මහනුවර දළදා මාලිගය... 


මහනුවර උපෝසථ පුෂ්පාරාම විහාරාධිපති,
තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන,
මහාවිහාරවංශික ස්‍යාමෝපාලි මහානිකායේ,
මහානායක ස්ථවිරයන් වහන්සේ,
මල්වතු මහාවිහාරය - මහනුවර.

වරකාගොඩ ඤාණරතන.
හඟුරන්කෙත විජයසුන්දරාරාම විහාරාධිපති
වරකාගොඩ ධම්මසිද්ධි ශ්‍රී පඤ්ඤානන්ද ඥාණරතනාභිධාන
මහාවිහාරවංශික ස්‍යාමෝපාලි මහානිකායේ,
මහානායක ස්ථවිරයන් වහන්සේ,
අස්ගිරි මහාවිහාරය - මහනුවර.


Scanned with CamScanner